# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 52 දරන සූතිකාධාර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 අගෝස්තු මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : ශත 35 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 52 දරන සූතිකාධාර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 අගෝස්තු මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 26/80.

**සූතිකාධාර ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 52 දරන සූතිකාධාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සූතිකාධාර ආඥාපනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **140 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(1) යම් ස්ත්‍රියකට සූතිකාධාර ගෙවීමේ හිමිකම ඇති කාල සීමාව ඇගේ දරු ප්‍රසූතියේ දිනය ද ඇතුළුව ඒ දිනය දක්වා සති දෙකක් සහ ඒ දිනයට ඉක්බිතිව ම සති හතරක් වශයෙන්, සති හයක් විය යුතු ය :

එසේ වුවද ඉහත කී සති දෙකක කාල සීමාව තුළ යම් දින ගණනක් ඒ ස්ත්‍රිය ඇගේ සේවයෙහි වැඩ කර ඇති අවස්ථාවක, ඇගේ දරු ප්‍රසූතියට පසුව, ඉහත කී සති හතරක කාල සීමාව අවසන් වන දිනයට ඉක්බිතිව ම වූ දින සිට ගණන් ගෙන ඒ දින ගණන සඳහා සූතිකාධාර ලැබීමට ඇයට හිමිකම තිබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ගැහැණු කම්කරුවකුගේ සේවායෝජක විසින් ඒ ස්ත්‍රියගේ දරු ප්‍රසූතියට පෙරාතුවම වූ සති දෙකක සහ ඇගේ දරු ප්‍රසූතියට ඉක්බිතිවම වූ සති හතරක සම්පූර්ණ කාල සීමාව සඳහා නියමිත අනුප්‍රමාණයන් අනුව සූතිකාධාර (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ඒ ගැහැණු කම්කරුවාට ගෙවිය යුතු ය :

එසේ වුවද, ඒ ගැහැණු කම්කරුවාගේ දරු ප්‍රසූතියට පෙරාතුවම වූ සති දෙකක කාල සීමාව තුළ යම් දිනයක ඒ ගැහැණු කම්කරුවා ඇගේ සේවයෙහි වැඩ කර ඇති අවස්ථාවක, ඇගේ දරු ප්‍රසූතියට පසුව, ඒ දිනය සඳහා සහ ඒ දිනයට පෙරාතුව වූ කාල සීමාවේ කොටස සඳහා සූතිකාධාර ලැබීමට ඇයට හිමිකම තිබිය යුතු ය.";

(2) එහි (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

2—ඒ 57189—13,425 (81/07)

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙසින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (4) ගැහැණු කම්කරුවකුගෙන් (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ යටතේ දැන්වීමක් ලැබුණු විට, සේවායෝජක විසින් ඒ ස්ත්‍රියගේ දරු ප්‍රසූතියට පෙරාතුවම වූ සති දෙකක සහ ඉක්බිතිවම වූ සති හතරක කාල සීමාව සඳහා සේවයට නොපැමිණීමට ඇයට අවසර දිය යුතු ය :

එසේ වුවද, ඒ ගැහැණු කම්කරුවා ඉහත කී සති දෙකක කාල සීමාව තුළ යම් දින ගණනක් ඇගේ සේවයෙහි වැඩ කර ඇති අවස්ථාවක, ඇගේ දරු ප්‍රසූතියට පසුව, ඉහත කී සති හතරක කාල සීමාව අවසන් වන දිනට ඉක්බිතිව ම වූ දින සිට ගණින් ගෙන ඒ දින ගණන සේවයට නොපැමිණීමට ඇයට අවසර දෙනු ලැබිය යුතු ය. "; සහ

(ආ) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.